# ජන්ම කේන්ද්‍රයේ භාව දොළසින් දුටු කර්ම බලය

ආයුර්වේද වෛද්‍ය ජ්‍යොතිෂ්‍ය විශාරද
**වෛද්‍ය ස්ටැන්ලි ධර්මකුමාර**
සිද්ධාර්ථ ආයුර්වේද හා ජ්‍යොතිෂ්‍ය මධ්‍යස්ථානය
නෝබල් පාක්



ජීවිතයේ සියලුම තොරතුරු පෙරාතුවට පෙන්වන පුදුම සහගත කැඩපතකි ජන්ම පත්‍රය. මෙලොව ක්‍රියාකාරකම් සසර පුරුදු පුහුණුකම් මතද වෙනස් වන්නට පුළුවන. මෙයම ජම්මයට වඩා පුරුද්ද ලොකු යයි පවසනු ඇත. සියල්ලම කර්මයෙන් පමණක් නොව ස්වාභාවික හේතූන් මතද යම් යම් වෙනස්කම් සිදුවනු ඇත. යම්කිසි ජන්මියකුගේ උත්පත්තියක් සිදුවන මොහොතක සූර්යාගේ බලය චන්ද්‍රයාගේ බලය සහ නැගෙනහිර ක්ෂිතජේයේ උදාවන රාශියේ බලය ජීවිතයක් ගෙනයාමේ අපූර්වාත්මක වූ ශක්තිය පිහිටා ඇත. මෙයින් උපන් බලවේගයන් රාශි 12 කොටුවලින් ජන්මිනයාගේ ජනක කර්ම විස්තර කළ හැකිය. ආදෝෂය සූර්ය කේන්ද්‍රයෙන්ද අමෝහ ලග්න කේන්ද්‍රයෙන්ද අලෝභ චන්ද්‍ර කේන්ද්‍රයෙන්ද පැහැදිලි කරගත හැකිය.

භාව හෙවත් ස්ථාන 12 මෙසේ කොටස් 4කට බෙදයි.

කේන්ද්‍රයේ කොටු
1, 5, 9 ධර්ම වශයෙන්ද
10, 2, 6 අර්ථ වශයෙන්ද
7, 11, 3 කාම වශයෙන්ද
4, 8, 12 මෝක්ෂ යනුවෙන් සඳහන් කරයි.

වැයුම්, ගීත, ග්‍රන් කථනය, ආලය මුල්වූ ප්‍රේම සම්බන්ධතා මෙහි අශුභ ග්‍රහයන් 5 පිහිටීම හෝ නොපිහිටීම නිසා දරුපල නොලැබීම, දරුවන් නොමඟ යෑම, අවලාද, අපහාස හා ආදරය නිසා නිතර නිතර වේදනා ද ගෙනදේ.

**උපපීඩිත කර්මය**
රෝග ස්ථාන, මෙහෙකරුවන්, ණ්‍ය ගනුදෙනු, නෑයන්, හදිසි අසනීප හා සැප සම්පත්ද පෙන්නුම් කරයි. අශුභ ග්‍රහ පිහිටීම්වලදී දරුණු රෝග, විශාල ණයවීම් හා නීති ප්‍රශ්න, සේවක සේවිකාවන්ගෙන් අවලාද ආදිය ලබයි.




**ජනක කර්ම**
ජන්මියාගේ පුරුෂත්වය, ශරීර ලක්ෂණ, ගති පැවතුම්, අධ්‍යාත්මික ගති පැවතුම්, ජීවන මග ප්‍රකාශ වේ. උපත ලබා දීමේදී ජනක කර්ම බලය පෙන්වා දෙයි. ලග්නයේ බලවත් ග්‍රහයෙකු උපතින් සිටිනම් ඔහුගේ ජීවන රටාව දිනෙන් දින දියුණුවට පත්වන අතර අශුභ ග්‍රහයෙකු පතිත වීනම් අශුභ කාල පරිච්ඡේදවලට පත් වීමට සිදුවේ.

**අචින්න කර්ම**
දෙවන ස්ථානයෙන් ධනය, දේපල, දකුණු අරත, ඇස් පෙනීම ආර්ථික පිරිහීම, යුගජීවිතයෙන් පසු ගත කරන කාල පරිච්ඡේදය, මරණය යන මේවා පැහැදිලි වේ. අකුෂල් කර ඉපදෙන ජන්මියාගේ අශුභ ග්‍රහයන් පිහිටීමෙන් මෙම ඉහත කී පල විපාක අශුභ වේ. ශුභ ග්‍රහයන් සිටී නම් ශුභ පල ලබයි.

**ආසන්න කර්ම**
සහෝදර සහෝදරියන්, අසල්වැසියන්, ඥාතීන්, කන් ඇසීම, කාර්මික ඥානය, ලිවීමේ හා කියවීමේ හැකියාව පිළිඹිබු වේ. මරණාසන්න මොහොතේදී ඇතිවන සිතුවිලි ආසන්න කර්ම නමින් හැඳින්වේ. ආසන්න කර්මයට ගරුක කර්මය හැර අනෙක් සියලුම කර්මයන් සමත් වේ. මියයන මොහොතේ දී සිතෙහි පහලවන චේතනාවට අනුව ඊළග භවයෙහි ප්‍රතිසන්ධිය ඇතිවෙයි. තුන්වන භාවයේ ශුභ ග්‍රහයන් සිටීනම් ඉතා හිතවත් සහෝදර පලද හිතවත් මිතුරු මිතුරියන්ද අසල්වැසියන් ද ලැබේ. එය දියුණුවට හා ආරක්ෂාවට ඉතා අවශ්‍යයි.

**ගරුක කර්ම**
ගෘහස්ථානය, මව, දායාදය, යානවාහන, ඉඩකඩම්, මවගේ ඥාතීන්, ජීවිතයේ අවසාන කාලය ගතවන ආකාරය, ලෝභ, ක්‍රෝධ අශුභ සිතිවිලි නොමැති ජන්මියාගේ හතරවන භාවයේ ශුභ ග්‍රහයන් පිහිටයි. ඉන් ජනමියාගේ ඉදිරි ජීවිතය සාර්ථක වේ. දෙමව්පියන්ගේ ආධාර උපකාර, සැප පහසුකම් හා ආදායම් සරුවේ.

**කටත්තා කර්ම**
දූ පුතුන්, ආගම, දර්ශණය, ඥාණය, නැටුම්,

**උපඝාතක කර්ම**
ස්ත්‍රී පුරුෂ සම්බන්ධය, යුගදිවිය, කොටස් කරුවන්, හවුල් ව්‍යාපාර, ධන හානි, ගරු නම්බු නාම, කීර්ති ප්‍රසංසා, තැන්පත් ධනය, රැකියා ස්ථිර හා අස්ථිර භාවය උත්පත්තිය ලබාදී ජීවිතය ඉදිරියට ගෙන යාමට උදව් වන කුසල බලයයි. යමෙකු ඉතා දිළිදුව උපන්නත් ඔහු උසස් ධනවතෙකු බවට පත්වීම මෙහි කර්ම බලය වේ.

**උපස්ථම්භක කර්මය**
මරණය පිළිබඳ සිදුවන ආකාරය, හදිසි අනතුරුද, උමතු රෝග, අන්‍යයන් නිසා දේපල අහිමිවීම, විවාහයෙන් දායාදය ලැබීම හෝ නොලැබීම, සහකරු හෝ සහකාරියගේ අසනීප හා මිය යෑම කලකෝලාහල, මාරක අනතුරු, මෙම උපස්ථම්බක කර්ම ශක්තියෙන් සියලු ඉහත කී කර්ම විනාශ වීමට ඉඩ ඇත.

**දිට්ට ධම්ම වේදනීය කර්මය**
භාග්‍යය, ශුභ, ගුරු, පුන්‍ය ස්ථානය, පියාට සැළකීම, තර්ක ඥානය, මවුපියන්ට ගරු සරු කිරීම, විදේශ ගමන්, දීර්ඝ වන්දනා ගමන්, මේ ආත්ම භවයේදීම විපාක දෙන මෙම කර්මය නිසා ආගමික ශක්තිය, දාන-මාන, පින්දහම් හා බණ භාවනා වලටද නැඹුරු වී කර්මය දුරු කරගත හැකිය.

**අපරාපරියවේදනීය කර්මය**
පියා, රැකියා, තනතුරු, දියණුව, මේ ආත්මයේදීම පලිසන් දීමට හැකිය. බුදුරජාණන් වහන්සේටද සය වසරක් දුෂ්කර ක්‍රියා කළ සමයේ චිංචිමානවිකාව නින්දා අපහාස කිරීම, දෙව්දත් ගල් පෙරලීම වැනි දේද මෙම කර්ම බලයෙන් සිදුවිය.

**උපපජ්ජ වේදනීය කර්මය**
ලාභ, අයස්ථානය, ලොතරැයි ජය, වැඩිමහල් සහෝ දරයන්, සමාජයේ තනතුරු වැනිදේ සඳහා මෙම කර්මය බලපායි.

**අහෝසි කර්ම**
දුක, ඊර්ෂියාව, වධ බන්ධනාගාර, හිර අඩස්සි, රහස් කුමන්ත්‍රණ, විදේශ ගතවීම, වසවිස පානය වැනිදේ මෙම කර්මය හේතුවෙන් සිදුවේ.

# යි/වු සහ ය්/ව් වෙනස ගැන ලියන අවසන් ලිපිය

සුබස් සිතිවලි

කුමාරතුංග පඬිතුමා ය / වූ දෙයකුර ය්/ව් වශයෙන් ගෙන ඇති බව ඔහුගේ පිය සමරේ ඇති සොලෝවලිනුත්, වැහි වලාකුල සොලෝ පෙලිනුත් පෙනෙන බව පසු ගිය ලිපියෙන් මම පෙන්වා දුනිමි. මා යි/වූ දෙයකුර ය්/ව් ලෙස ලියන්නට පටන් ගත්තේ එය දකින්නට කලිනි. පය්ය/පව්ව, අය්යා/අව්ව යන වචනවල ඉතා පැහැදිලි ව කියවෙන ය්/ව් දෙයකුර ගතානුගතික ව යි/වු ලෙස ලියන්ට අකමැතිවීම එයට හේතුවයි. ග්‍රැහය, ගෙය අපට හුරු පුරුදුය. එහෙත් අප ග්‍රැහය ලියන්නේ " ගෘහය - ග්‍රිහය" කියාය. "පෑන" ඉංගිරිසියේ "පෙන් " යන්න සිය බසට ගෙන ඇති සැටියි. අපි " පෙනෙන් ලියනවා - පෙනේ තුඩ කැඩිලා" නොකියා "පෑනෙන් - පෑනේ" කියන්නේ එය අපේ බසේ වියහර වන විදියටයි. අප ලියන්නේත් "පෑන" යනුවෙනි. ඇය් අප "ග්‍රැහය" යනුවෙන් බාවිත කරන වචනය "ගෘහය- ග්‍රිහය" යනුවෙන් ලියන්නේ. ග්‍රැහය, වුර්කතා, ක්‍රැතිය කියන අපි ගෘහය, වෘකයා, කෘතිය ලියමු. එසේ ලියනවා නම් ඒ වචන නිවැරදි ව ශබ්ද කල යුතුය. ග්-ර්-හ-ය, ව්-ර්-ක-යා, ක්-ර්-ති-ය නිවැරදිය. එක්ම අකුරු හතර ටිය(ර්), ටෙය(ර්) යනුවෙන් දෙව්දියකට කීම හෝ " පෙය(ර්)" යන්න දෙව්දියකට ලිවීම ඉංගිරිසියේ සිරිතයි. සිංහලයේ සිරිත එය නොවේ.




කියන - කියවෙන විදියට ලිවීමත්
ලියන - ලියාපු විදියට කියවීමත් අපේ සිරිතයි.
ගස ම ගහ, රස ම රහ වන බව ඔබ දනිති. ගස-රස වචන දෙකේ මුලකුර විවුර්තවත්, දෙවන අකුර සංවුර්තවත් කියවේ. කර, කරන, කරවන යන වචන "සංවුර්ත" ව කියවෙන සැටිත් "කලහ පනහ" විවුර්ත ව කියවෙන සැටිත් තේරුම් ගන්න.

මුලින් ඇති විවුර්ත "අ" ශබ්දයේ බලපෑම නිසා (සහ-ගහ-පනහ-පෙලවහ) "හ" යන්නත් විවුර්ත ව කියවේ. තිහ-පහ-ඉහල-කුහර එසේ නොවන්නේ මුලින් ඇත්තේ "අ" ස්වරය නොවන නිසා ය.

ගස-ගසක්-ගසත් යන තුන් පලේ ඇති "ස" යන්න සංවර්තව කියවෙන සැටිත් එය ම "විවුර්ත" ව කිය-වෙන සැටිත් තේරුම් ගන්න. එසේ වන්නේ ඇය්?

හල් අකුරක් / හ යන්නක් පෙරටු කොට ඇති සංවුර්ත 'අ' හඬ විවුර්තව කියැවීම සිංහල බාසාවේ රීතියක් නිසාය.

මේ වචන කියවන විට ඇති වන වෙනස තේරුම් ගන්න.
"කොරස/ කොරහ, පනස/පහන, ගසක/ගසක්, මලක/මලක්, මුලක/මුලක්, කොලයක/කොලයක්, වලඳක/වලඳක්, උගුලක/උගුලක්, අග ඇති "හ" යන්නත් අග ඇති "හල් අකුරත්" නිසා පෙර ව ඇති "අ" හඬ සහිත අකුර "විවුර්ත" වන සැටි තේරුම් ගන්න. මුලකුර විවුර්තව කියැවෙන්නේ ඉදිරියෙන් ඇති ය්/ව් නිසායි. එය යි/වු නොවේ.

කපන-කපය් /කපත් ගසන - ගසය් / ගසත් තවන - තවරන - තවය් / තවත්, තවරය්/තවරත් ගරන-ගල්වන - ගරය්/ගරත්, ගල්වය්/ ගල්වත්

දැන් ඔබට තේරුම් ගත හැකිය, "ය්" යන්නට පෙරව ඇති "අ" විවුතව කියවෙන බව.

"දිවයින" යන්නේ ඇත්තේ "ය් " නොව "යි" ය. එනිසා එහි "ව" යන්න සංවුර්තව ම කියවේ.

ඒ අනුව ම, අලව්ව-අඩව්ව-ඉලවීව-ඉසව්ව-උලව්ව-උදව්ව-වලව්ව - යන වචනවල ව් යන්නට පෙර ව ඇති අකුර විවර්තව කියවෙන හැටි බලන්න. කව්රු ලිව්වත්,සම්මතය එය උනත් මා යි/වු වෙනුව ය්/ව් ලියන්නේ මේ හේතුව නිසා ය.

